# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
## UNIVERSITY OF SRI JAYEWARDENEPURA, SRI LANKA

මගේ අංකය
My Number

ඔබේ අංකය
Your Number

නුගේගොඩ
ශ්‍රී ලංකාව
NUGEGODA
SRI LANKA

තැපැල්පෙට්ටිය - 6 - නුගේගොඩ.
Post office box - 6 - Nugegoda.

2019.02.15

ස්වාමීන්වහන්ස,
ප්‍රිය ශිෂ්‍ය ශිෂ්‍යාවනි

**<u>සමාජ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලා සමර්පණෝත්සවය</u>**

මෙම විශ්වවිද්‍යාලයේ පවත්වනු ලැබූ සමාජ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථක ලෙස අවසන් කිරීම පිළිබඳව ප්‍රථමයෙන් ඔබ වෙත විශ්වවිද්‍යාලය වෙනුවෙන් මාගේ සුභ පැතුම් පිරිනමමි.

ඊට අදාල සහතික පත් ප්‍රදානෝත්සවය 2019 මාර්තු මස 19 වන දින ප.ව. 4.00 ට කොළඹ 07, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ ලෝටස් මන්දිරයේදී අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට කටයුතු සුදානම්කර ඇති අතර එදින පෙරවරු 3.00 වන විට එම පරිශ්‍රයට ඔබ පැමිණ සිටිය යුතුය.

ඩිප්ලෝමා සමර්පණෝත්සවයේ සියලු වියදම් වෙනුවෙන් ඩිප්ලෝමා ලාභියෙකුගෙන් රු.4,500.00 ක මුදලක් අයකිරීමට තීරණය කර ඇති අතර, අදාල මුදල් මහජන බැංකුවේ විශ්වවිද්‍යාලයීය ***ගිණුම් අංක 097-1001-50005005*** දරණ ගිණුමට බැරකර, එහි රිසිට්පත හා ඔබ විසින් සම්පූර්ණ කරන ලද මේ සමග එවා ඇති අයදුම් පත ද සමග **2019.03.05** වන දින වනවිට **සහකාර ලේඛකාධිකාරි, මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය, ගංගොඩවිල, නුගේගොඩ** යන ලිපිනයට තැපෑලෙන් හෝ පැමිණ භාරදිය යුතු වේ.

**<u>ඩිප්ලෝමා සමර්පණෝත්සවයට සහභාගීවන්නන් සඳහා උපදෙස්</u>**

***ඩිප්ලෝමා ලෝගු ලබා ගැනීම හා නැවත භාර දීම***

2019.03.19 වන දින ප.ව.3.15ට ලෝටස් මන්දිර පරිශ්‍රයේ ස්ථාපිත කර ඇති විශේෂ කවුන්ටරයෙන් ඔබට ලෝගු ලබාගත හැකිවන අතර **<u>උත්සවය අවසානයේ සියලුම ලෝගු නැවත එම කවුන්ටරය වෙත භාර දිය යුතුය.</u>**

***ඩිප්ලෝමා ලාභීන්ගේ පෙරහැර***

සියලු ඩිප්ලෝමා ලාභීන් ලබා ගත් ලෝගුව පැළඳ ස්වකීය පෙරහැර අංකයේ අනුපිළිවෙළට (පෙරහැර අංකය ඉදිරියේදී ලබා දෙනු ඇත) පෙළ ගැසී පෙරහැරේ ගමන් කළ යුතුය. කිසිඳු ඩිප්ලෝමා ධාරියෙකුට උත්සවය අවසන්වන තෙක් තම අසුනෙන් ඉවත්විය නොහැකිය.

***ඇඳුම් සහ ප්‍රවේශ පත්‍ර***

ඩිප්ලෝමාලාභී කාන්තාවන් අභිමත වර්ණයක සාරි හෝ ඔසරිවලින් ද පිරිමි ජාතික ඇඳුමින් හෝ ටයි පටිය සහිත යුරෝපීය ඇඳුමින් ද සැරසී පැමිණිය යුතුය. ඉඩකඩ සීමිත බැවින් ඩිප්ලෝමා ලාභියාට අමතරව තවත් එක් අමුත්තෙකුට පමණක් උත්සවය නැරඹීම සඳහා ශාලාව තුළට ප්‍රවිශ්ඨ වීමට ප්‍රවේශ පත්‍ර නිකුත් කෙරේ.

***ඩිප්ලෝමා සහතික පිරිනැමීම නිමාව***

උත්සවය අවසානයේ තේ පැන් සංග්‍රහයක් පැවැත්වෙන අතර ඔබ දෙපළටම ඒ සඳහා සහභාගී විය හැකි අතර තේ පැන් සංග්‍රහයට අදාල ප්‍රවේශ පත්‍ර ලෝගුව සමග ඔබ වෙත ලබා දෙනු ඇත.

***සැලකිය යුතුයි:*** සහතික පිරිනමන අවස්ථාවේ දී සභා ගර්භය තුළ දුරකථන ඇමතුම් ලබා ගැනීම හෝ ඡායා රූප ගැනීම සඳහා ජංගම දුරකථන හෝ කැමරා භාවිතා කිරීම, නැගී සිටීම සපුරා තහනම් වේ.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය